## ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

ස්ථාවර වත්කම් සඳහා වර්ෂය තුළ වෙන්කළ යුතු ක්ෂය ප්‍රමාණය හා ගිණුමේ දැක්වෙන පරිදි වෙන්කරන ලද ක්ෂය ප්‍රමාණය අතර එකතුව රු. 276,974 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 19 (3) වගන්තිය | අදාල නියමයන්ට අනුව අධිකාරිය විසින් තාක්ෂණ සංවර්ධන අරමුදලක් පිහිටුවා තාක්ෂණ සංවර්ධන කාර්යයන් සඳහා වෙන් කරන ලද හෝ ලැබෙන සියළු මුදල් එම අරමුදලට බැර කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම අරමුදල පිහිටුවා නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාස | |
| | (i) මු.රෙ. 103 හා 104 | අනතුරකට පත් වූ වාහනයක් වෙනුවෙන් අධිකාරියට සිදුවූ රු.56,279 ක්වූ මූල්‍ය අලාභය අදාල වගකිව යුතු පාර්ශවයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (ii) මු.රෙ.110 | පාඩු හා හානි ලේඛණයක් අධිකාර්ය විසින් පවත්වා නොතිබුණි. |
| | (iii) මු.රෙ. 388 | චෙක්පත් තැපැල් කිරමේදී තබාගත යුතු ලේඛනය අධිකාර්ය විසින් පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | |
| | (i) 5.2.1 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පහත දැක්වෙන කරුණු ඇතුළත්ව අයවැය ලේඛනයක් පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.<br>- අයවැයගත ආදායම් හා වියදම් ගිණුම<br>- අයවැයගත ශේෂපත්‍රය<br>- අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය |
| | (ii) 8.3.9 වගන්තිය | රේඛීය අමාත්‍යාංශ විසින් තම අධීක්ෂණයට යටත් ආයතනවල සම්පත් පරිහරනය නොකළ යුතු වුවද, එය නොසලකා අධිකාර්යට අයත් කැබ් රථයක් හා රියදුරු 2012 ජූලි 09 දින සිට අමාත්‍යාංශයේ කටයුතුවලට අනුයුක්ත කර තිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | අධිකාර්ය විසින් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) | 2011 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී/ 58 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | හිටපු සභාපතිවරයා වෙනුවෙන් අනුමත දීමනාව මසකට රු. 50,000 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා මසකට රු.62,695 බැගින් අධිකාර්ය විසින් ගෙවා තිබුණි. මේ අනුව වැඩිපුර ගෙවා තිබූ රු.111,083 ක්වූ දීමනාව අයකර ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | 2011 ජුනි 01 දිනැති අංක එන්එස්සීස/2/7/5/5/113 දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලිපිය. | ලිපයෙන් අනුමත වැටුප ඉක්මවා වැටුප් ගෙවා තිබීම හේතුවෙන් අධිකාරියේ අධ්‍යක්ෂවරයා වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු. 252,450 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද විස්තීරණ ආදායම් ප්‍රකාශනය අනුව, සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියේ වැඩ කටයුතුවලින් රු. 2,050,079 ක ඌනතාවයක් පෙන්නුම් කළ අතර, ඉකුත් වර්ෂයේ ඊට එරෙහිව රු.708,537 ක අතිරික්තයක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී රු. 2,758,616 ක මූල්‍ය ප්‍රතිඵලයේ දැඩි පිරිහීමක් සිදුවී තිබුණි. පරිපාලන වියදම් රු.5,390,754 කින් වැඩිවීම පිරිහීම ඇතිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වියදම් රු.4,053,540 කින් හෙවත් සියයට 21 කින් අඩු වීම සහ භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන සහ විලම්භිත ප්‍රාග්ධන ආදායම රු.2,701,305 කින් හෙවත් සියයට 13කින් වැඩිවීමත් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන වැය රු. 5,390,754 කින් හෙවත් සියයට 26 කින් වැඩිවීමත් මෙම මෙහෙයුම් ප්‍රතිඵලයේ වූ රු. 2,758,616 ක පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් අයථා පරිහරණය

හිටපු සභාපතිවරයෙකු විසින් ලබාගෙන තිබූ රු.280,000 ක්වූ ලැප්ටොප් පරිගණක 02 ක් 2014 ජනවාරි 22 දින වනවිටත් අධිකාරිය වෙත නැවත භාරදී නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාර ගිණුම් වර්ෂය ඉකුත් වී ඊලඟ වර්ෂයේ පෙබරවාරි 28 දිනට ප්‍රථම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, 2012 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කරන ලද්දේ මාස 07 ක් ප්‍රමාදයකින් පසු 2013 ඔක්තෝබර් 02 දින දීය.

## 4.2 සංයුක්ත සැලැස්ම

-------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ**

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව සංයුක්ත සැලැස්මෙහි පසුගිය වර්ෂ 03 ට අදාල මෙහෙයුම් ප්‍රතිඵල දැක්විය යුතු වුවත්, අධිකාරිය විසින් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කරන ලද සංයුක්ත සැලැස්මෙහි 2006 - 2008 වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රතිඵල පමණක් දක්වා තිබුණි.

(ආ) සංයුක්ත සැලැස්මේ දැක්වෙන මෙහෙයුම් සැලැස්මෙහි ක්‍රියාකාරකම් තුළ අධිකාරිය ස්වයං මූල්‍ය ස්ථාවරත්වය ලඟා කරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් හෝ ඉලක්කයන් ඇතුලත් කර නොතිබුණි. තවද ඉකුත් වර්ෂයේ අධිකාරිය විසින් උපයාගත් ආදායම රු. 126,526 ක් වුවද 2012 වර්ෂයේදී රු. 57,359 ක් දක්වා එනම් සියයට 55 දක්වා අඩුවී තිබීමෙන් සංයුක්ත සැලැස්මේ ඉලක්කය කරා අධිකාරිය ක්‍රියාත්මක වී නොතිබුණි.

## 4.3 අයවැය පාලනය

-------------------

අයවැයගත හා තථ්‍ය අගයන් අතර, සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය, ඵලදායි කළමණාකරන පාලන කාරකයක් ලෙස භාවිතා කරගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) වත්කම් පාලනය

(ආ) අයවැය පාලනය